සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

13 ශ්‍රේණිය

# යුරෝපා ඉතිහාසය

පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 4 ) | 02. ( 5 ) | 03. ( 4 ) | 04. ( 4 ) | 05. ( 4 ) | 06. ( 4 ) | 07. ( 5 ) | 08. ( 4 ) | 09. ( 3 ) | 10. ( 4 ) |
| 11. ( 3 ) | 12. ( 2 ) | 13. ( 4 ) | 14. ( 3 ) | 15. ( 3 ) | 16. ( 5 ) | 17. ( 5 ) | 18. ( 3 ) | 19. ( 2 ) | 20. ( 1 ) |
| 21. ( 2 ) | 22. ( 5 ) | 23. ( 5 ) | 24. ( 2 ) | 25. ( 2 ) | 26. ( 2 ) | 27. ( 4 ) | 28. ( 4 ) | 29. ( 5 ) | 30. ( 5 ) |
| 31. ( 3 ) | 32. ( 4 ) | 33. ( 1 ) | 34. ( 3 ) | 35. ( 4 ) | 36. ( 2 ) | 37. ( 1 ) | 38. ( 4 ) | 39. ( 2 ) | 40. ( 3 ) |

## II කොටස

01. (1) එංගලන්තය / ප්‍රංශය / ස්පාඤ්ඤය

(2) එංගලන්තය හත්වන හෙන්ද්‍රි / අටවන හෙන්ද්‍රි
ප්‍රංශය XIII ලුවී
ස්පාඤ්ඤය ෆර්ඩිනන් ඉසබෙලා / I චාල්ස්

(3)
- ★ නිශ්චිත භූගෝලීය දේශ සීමාවකින් යුක්ත වීම.
- ★ ස්වෛරී රාජාණ්ඩුව
- ★ ප්‍රාදේශීය පාලකයන්ගේ බලය සීමා වීම
- ★ පෞද්ගලික නිලාකාර හමුදා අහෝසි කිරීම.
- ★ රජු ස්ථිර හමුදාවක් පවත්වාගෙන යාම
- ★ ජාතික නීති පද්ධතියක් බිහි වීම.

(4)
- ★ ජාතික රාජ්‍ය මඟින් ජාති මාමක අදහස් ප්‍රචලිත විය.
- ★ වාණිජ වාදය ඉස්මතු විය.
- ★ දේශපාලන ක්ෂේත්‍රය තුළ පැවති ක්‍රමවේදය වෙනස් විය.
- ★ එමඟින් මධ්‍යම පන්තිය ශක්තිමත් විය.
- ★ දේශ ගවේෂණය සංසිද්ධි ඇති වීමට ජාතික රාජ්‍ය මඟින් විශාල පිටුවහලක් ලැබුණි. (විස්තර කර තිබිය යුතුය.)

02. (1)
- ★ පෘතුගාලයේ නාවික හෙන්රි රජුගේ දායකත්වය
- ★ නාවික පාසල්, විශ්වවිද්‍යාල ඇති කර නව සොයා ගැනීම් සිදු කර නාවික කටයුතු පහසු කිරීම.
- ★ 1498 වස්කෝද ගාමා ඉන්දියාව සොයා ගැනීම.
- ★ 1488 බර්තොලමියු ඩයස් ශුභ පැතුම් තුඩුව සොයා ගැනීම.
- ★ ස්පාඤ්ඤය පාලනය කළ ෆර්ඩිනන් ඉසබෙලා යුවලගේ දායකත්වය
- ★ 1492 දී ක්‍රිස්ටෝපර් කොලම්බස් ඇමරිකාවට ගොඩ බැසීම.
- ★ මෙක්සිකෝ හා පීරු ප්‍රදේශ කෝටෙස් හා පිසාරෝ විසින් ගවේෂණය කිරීම.

(2)
- ★ ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකා යන මහද්වීප වල යුරෝපා බලය ව්‍යාප්ත වීම.
- ★ නව වෙළඳ නගර බිහි විය. (ලිස්බන්, පැරිස්)
- ★ කාර්මික විප්ලවයට මඟ පෑදීම.
- ★ ක්‍රිස්තු ධර්මය ලොව තුළ ව්‍යාප්ත වීම.
- ★ යුරෝපා සංස්කෘතිය හා තාක්ෂණය ලොව පුරා ව්‍යාප්ත වීම.
- ★ නව විදේශ සබඳතා

03. (1) යුරෝපා සම්මේලනය
ප්‍රංශයේ නැපෝලියන් විසින් යුරෝපයේ දේහ සීමා අවුල් කොට නව රාජ්‍ය තනා තිබුණි. 1815 දී ඔහු පරාජය වීමත් සමඟ නැවතත් 1789 දී තිබූ යුරෝපය දක්වා ගෙනයාමට මෙටර්නික්ගේ ප්‍රධානත්වයෙන් 1815 දී වියානා සම්මේලනය පවත්වා සාමූහිකව සාමය පවත්වා ගැනීමේ ප්‍රයත්නයක් දැරීය. පසුව අයිලා ෆැපේල්, ට්‍රොපව්, වෙරෝනා ආදී සම්මුතීන් ද පැවැත් වීය.

වෙස්ට්ෆේලියා ගිවිසුම
1648 දී 30 අවුරුදු යුද්ධ අවසාන වන්නේ මෙම සාමදාන ගිවිසුම අත්සන් කිරීමෙනි. මෙයට ප්‍රධාන හේතුව වූයේ කැල්වින් ආගමට නිසි තැනක් නොලැබීමය. මින් පසුව එයට නිසි තැන ලැබුණ අතර ලූතරන් පාලකයාගේ ආගමද ජනතාවගේ ආගමක් විය. මෙයින් පසු යුරෝපයේ ආගමික යුද්ධ යලි ඇති නොවිණි. අතුරු ප්‍රතිඵලද විය. එනම් බූර්බන් බලය නැගී ඒම, ප්‍රංශයේ රිචලියුගේ අපේක්ෂා ඉටු වීම.

පුනරුදය
කුරුස යුද්ධයෙන් යුරෝපීයන් පරදා වූ පසු කොන්ස්තන්තිනෝපලය සතුව තිබූ පොත්පත් යුරෝපයට රැගෙන යාමෙන් පැරණි ග්‍රීක රෝම පොත් පත් පරිශීලනය කර දැනුම ලබා නැවත ප්‍රබෝධයක් සෑම ක්ෂේත්‍රයක් තුළම වර්ධනය විය. (විස්තරාත්මකව දක්වන්න.)

ප්‍රතිරෙපරමාදුව
පුනරුදයත් සමඟ වූ බුද්ධ ප්‍රබෝධය නිසා ප්‍රතිරෙපරමාදුව ඇති විය. රෝමානු කතෝලික ආගමේ නෙයෙකුත් දූෂන දකීම මෙයට හේතුවයි. රෝමානු කතෝලිකයන් තමන්ට වන අසාධාරණ මැඩලීමට ප්‍රතිරෙපරමාදුව අරඹීය.
කතෝලික ආගම යලි නැංවීමටත් ප්‍රචාරය කිරීමටත් රෙපරමාදු ආගම පිටු දැකීමටත් මෙය ඇරඹීය.

අධර්ම ධර්මනාධිකරණය / ජෙසුයිට් නිකාය / ට්‍රෙන්ට් සම්මේලනය පැවැත්වීම අදායි එහි ලා වැදගත් වේ.

04. (1) ★ ක්‍රිස්තු සභාව ධනවත් ආයතනයක් වීම. ★ කතෝලික පූජකවරු සුඛෝපභෝගී ජීවිත ගත කිරීම.
★ බල අධිකාරිය පවත්වා ගැනීමට ක්‍රිස්තු සභාවගත් ක්‍රියාමාර්ග
★ පාප් ධුරයට තිබූ ගෞරවය පිරිහීම. ★ පාප් වහන්සේලා කිහිපදෙනෙකු එකවර පත්වීම.
★ තම රටවල ධනය වාර්ෂිකව රෝමටය ඇදීයාම පිළිබඳව ජනතාව තුළ වූ විරෝධය.
★ ක්‍රිස්තු සභාව සතු ධනය තමන් සතු කර ගැනීමට රජවරු සහ වෙළඳ පන්තිය උත්සාහ කිරීම.
★ ප්‍රත්‍ය එල පත්‍රිකා අලෙවි කිරීම. ★ පල්ලියේ උසස් තනතුරු මුදලට විකිණීම.
★ ධනය ඉපයීමට පල්ලිය අනුගමනය කළ උපක්‍රම.

(2) ★ එක්සත් ක්‍රිස්තු සභාව බිඳ වැටීම. (රෝමානු කතෝලික / රෙපරමාදු ක්‍රිස්තියානි)
★ යුරෝපය ආගමික වශයෙන් දෙකඩ වීම. ★ පාප් තුමාගේ බලය පිරිහීම.
★ ශුද්ධ රෝම අධිරාජ්‍යයාගේ බලය දුර්වල වීම. ★ ආගමික නායකත්වය රාජ්‍ය පාලනයට යටත් වීම.
★ ආගම තුල නිකාය ඇති වීම. ★ ආගමික තරඟය හා ගැටුම් (තිස් අවුරුදු යුද්දය)
★ මිෂනාරි ව්‍යාපාර

05. (1) ආසන්න හේතුව ★ ඔගස්බර්ගේ සම්මේලනයේ තීරණ වල අඩුපාඩු ★ එම තීරණ ක්‍රියාත්මක නොවීම.
★ රෝමානු කතෝලිකයන් රෙපරමාදුවාදීන්ට පීඩා කිරීම. ★ ජර්මන් ප්‍රදේශවල විවිධ ආගමික කණ්ඩායම් සිටීම. (ලූතර්, කැල්වින්, රෝමානු කතෝලික)
★ ජර්මනියේ ස්වාධීන ආදිපාදිවරු අතර මතභේද ★ බූර්බන් හා හැප්ස්බර්ගේ රාජවංශය අතර ගැටුම්
★ බොහිමියන් සිදුවීම.

(2) යුද්ධයේ ප්‍රධාන අවස්ථා ★ බොහිමියන් අවධිය ★ ඩෙන්මාර්ක් අවධිය
★ ස්විඩන් අවධිය ★ ප්‍රංශ අවධිය

(3) ★ යුරෝපයේ ආගමික ගැටුම් සමථයකට පත්වීම.
★ පාප් වහන්සේගේ බලය රෝමානු කතෝලික සභාව තුළ තහවුරු වීම.
★ ශුද්ධ රෝම අධිරාජ්‍ය තනතුර නාමමාත්‍රික වීම. ★ බූර්බෝන් වංශය යුරෝපයේ බලවත්ම රාජවංශය වීම.
★ ජර්මන් ප්‍රාදේශීය කුමාරවරු බලවත් වීම. ★ ස්විඩනයට බෝල්ටික් මුහුදේ වෙළඳ අධිකාරිය ලැබීම.
★ ස්විස්ටර්ලන්තය හා නෙදර්ලන්තය ස්වාධීන රාජ්‍යයක් වීම.

06. (1) ★ 16 වන ලුවී රජු විසින් ස්ටේට්ස් ජනරල් සභාව කැඳවීම හා ආර්ථික තත්වය දුර්වල වීම හා ආහාර හිඟය නිසා වර්සායි මාලිගය අවට රැස් වී පාන් ඉල්ලමින් කෑ ගැසූ ජනතාවට බිසව විසින් පාන් නැත්නම් කේක් කාපල්ලා කියා පිළිතුරු දුන්විට උරණ වී බැස්ටීලයට පහර දී හිරකරුවන් එළියට ගැනීම.

(2) ★ වරප්‍රසාද නොලැබූ මධ්‍යම පන්තිය ★ අධික බදු බරෙන් තෙරපී සිටි ගොවි පන්තිය
★ රදළයින් අධික වරප්‍රසාද භුක්ති විඳීම. ★ අකාර්යක්ෂම පාලනයක් සහිත පාලනය
★ පූජකවරුන්ගේ ද විෂමතා රැසක් තිබීම.

(3) ★ ප්‍රංශ සමූහාණ්ඩුව පිහිටු වීම. ★ 1793 දී 16 වන ලුවී රජු මරා දැමීම.
★ ප්‍රංශ සමූහාණ්ඩුවට එරෙහි යුද්ධ. ★ 1793 1795 භීම සමය.
★ අධ්‍යක්ෂක මණ්ඩලය පත් වීම. ★ කොන්සල් ක්‍රමය ආරම්භය.
★ නැපෝලියන් බලයට පත් වීම.

07. 1815 දී වෝටර්ලූ සටන පරාජය වීමත් සමඟ නැපෝලියන් බොනපාර්ට් විසින් යුරෝපයේ ඇතිකර තිබූ අධිරාජ්‍යවාදය බිඳ වැටීම සිදුවිය. ඒ සඳහා වියානා සම්මේලනය මගින් 1789 ට පෙර එනම් ප්‍රංශ විප්ලවය ඇති වීමට පෙර තිබූ යුරෝපය ඇති කිරීමට ක්‍රියාමාර්ග රැසක් ගනු ලැබුවා. (මෙම කරුණු විස්තරාත්මකව දැක්විය යුතුය.)

08.

